# පුවත් හසුන

## උක් පර්යේෂණ ආයතනය

වෙළුම 02 කාණ්ඩය 01 ඔක්තෝබර් 2007


## උක් පර්යේෂණ ආයතනය නව අමාත්‍යංශයක් යටතට

2007 වසර තුල උක් පර්යේෂණ ආයතනය අතිරේක වැවිළි බෝග අමාත්‍යංශය යටතට පත් කිරීමෙන් අනතුරුව, ගරු ධර්මදාස බණ්ඩා මැතිතුමා නව ඇමති වශයෙන් පත් කරන ලදි.







නව ඇමතිතුමා උක් පර්යේෂණ ආයතනය ට පැමිණි අවස්ථාව

### ඇතුලත පිටු


- උක් කර්මාන්ත තොරතුරු
  - පැල්වත්ත එස්.එල්-8306 ව්‍යාප්තිය වැඩි කරයි.
  - සෙවනගල එස්.එල්.අයි 121 උක් ප්‍රභේදය ප්‍රචලිත කිරීමට පියවර.
  - බිබිලට උක් කර්මාන්තායතනයක්
  - හිඟුරාන වැඩ අරඹයි.
  - ගම නැගුමට උක් පර්යේෂණ ආයතනයේ දායකත්වය
- පර්යේෂණ හා ව්‍යාප්ති තොරතුරු
  - වූල් කූඩිත්තා මර්දනයට පියවර
  - නව උක් ප්‍රභේද ගොවි බිම් තුල දී අධ්‍යයනයට ලක් වේ.
  - උක් වගාවන් සඳහා නව පොහොර නිර්දේශයන්.
  - උක් සිටුවීමේ ලාභදායක නව ක්‍රමයක්
- ආයතන තොරතුරු
- සීනි නිෂ්පාදනය පිළිබඳ වර්ථමාන තොරතුරු
- බලශක්තියක් ලෙස එතනෝල්
- වයඹ පළාත් සභාවෙන් උක් ආශ්‍රිත ග්‍රාමීය ව්‍යාපෘතියක්


### උක් පර්යේෂණ ආයතනීය ඉංජිනේරු අංශයෙන්

## බීජ උක් උණුදිය ප්‍රතිකාර කිරීමට වැඩි ධාරිතාවයෙන් යුත් යන්ත්‍රයක්



නිරෝගී බීජ උක් ලබා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වූ වැඩි ධාරිතාවකින් යුත් උණුදිය ප්‍රතිකාර යන්ත්‍රයක් නිර්මාණය කර උඩවලව උක් පර්යේෂණ ආයතන භූමිය තුළ ස්ථාපනය කිරීමට ආයතනීය ඉංජිනේරු අංශය සමත් විය. වර්ථමාන උක් කර්මාන්තය මුහුණ දී ඇති බරපතල රෝගී තර්ජනයන් හමුවේ උක් පර්යේෂණ ආයතනය විසින් සුලසුම් කර ඇති නිරෝගී බීජ උක් නිපදවා මූලික තවාන් සඳහා ලබාදීමේ වැඩකටයුතු සිදුකිරීම සඳහා වැඩි ධාරිතාවකින් යුත් කාර්යක්ෂම උණුදිය ප්‍රතිකාර යන්ත්‍රයක් නොමැති වීම විශාල අඩුපාඩුවක් ව පැවතිණි. මෙමගින් එම කටයුතු කඩිනමින් ඉටුකර ගැනීමට මෙන්ම අනෙකුත් පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය නිරෝගී බීජ උක් අඩු වියදමකින් කාර්යක්ෂමව පිළියෙල කිරීමටද හැකිවේ.

රුපියල් මිලියන 2 පමණ වටිනාකමකින් යුත් පැයකදී බීජ උක් ටොන් එකක් ප්‍රතිකාර කිරීමේ ධාරිතාවකින් යුතු මෙම උණුදිය ප්‍රතිකාර යන්ත්‍රය නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) කේ.සන්මුගනාදන් මහතාගේ මග පෙන්වීම යටතේ පර්යේෂණ නිළධාරී දිමුතු අබේරත්න මහතා ඇතුළු ඉංජිනේරු අංශ කාර්ය මණ්ඩලයේ කැපවීමෙන් ආයතනීය නව නිර්මාණයක් ලෙස නිපදවා ඇත. සෙවනගල සීනි සමාගමේ බර්ටි කුලගම්මන හා ජේ. ආර්. මලල්ගොඩ මහතුන්ගේ තාක්ෂණික උපදෙස් හා ආයතනීය නඩත්තු අංශයෙන් මේ සඳහා ලබාදුන් දායකත්වය මත ඉතා කෙටි කලක් තුළ මෙහි මූලික කටයුතු අවසන් කර ස්ථාපනය කිරීමට හැකිවී ඇත.

(5 වන පිටුවට ⇨)

## පැල්වත්ත උක් කර්මාන්තායතනය එස්.එල්.8306 ව්‍යාප්තිය වැඩිකරයි

මෑත කාලයේදී උක් කර්මාන්තයට විශාල බලපෑමක් ඇති කල සුදු පත්‍ර රෝගය ව්‍යාප්තියත් සමග උක් කර්මාන්තායතන රෝග හා පළිබෝධ හානි වලට ඔරොත්තු දෙන නව උක් ප්‍රභේද භාවිතය වැඩි කිරීමට පියවර ගෙන ඇත. මේ අනුව පැල්වත්ත උක් කර්මාන්තායතනය එස්.එල්. 8306 ප්‍රභේදය දැනටමත් සිය කේන්ද්‍රීය වගාව තුල මෙන්ම ජනාවාස හා පිටස්තර ගොවි ප්‍රදේශ තුලද ව්‍යාප්තිය වැඩි කර ඇත. ඒ අනුව මුළු වගාබිම් ප්‍රමාණයෙන් 43% ක් එනම් හෙක්ටයාර 4500ක් පමණ ප්‍රදේශයක එස්.එල්. 8306 ප්‍රභේදය මේ වන විට වගාකර ඇත. මෙම ප්‍රභේදයෙහි සීනි ප්‍රතිශතය ඉහල මට්ටමක පවතින බැවින් එය ආයතනයන්හි සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය ඉහල නංවා ගැනීමටත් එමගින් සීනි නිෂ්පාදන වියදම අඩුකර ගැනීමටත් ඉවහල් වනු ඇත.

## සෙවනගල උක් බිම් තුල එස්.එල්.අයි 121 උක් ප්‍රභේදය ප්‍රචලිත කිරීමට පියවර

උක් පර්යේෂණ ආයතනය විසින් මෑතකදී ගත් පියවර හේතුවෙන් එස්.එල්.අයි. 121 උක් ප්‍රභේදය සෙවනගල වාරි පෝෂිත ප්‍රදේශය තුල ව්‍යාප්තිය ඉහල යමින් පවතින අතර දැනටමත් උක් බිම් 16 ක් සඳහා මෙම ප්‍රභේදය භාවිතා කර ඇත. 1992 දී වාරිපෝෂිත තත්ව යටතේ වගා කිරීමට සුදුසු සාපේක්ෂව සීනි හා උක් අස්වැන්න වැඩි ප්‍රභේදයක් ලෙස එස්.එල්.අයි. 121 උක් ප්‍රභේදය මුලින්ම හඳුන්වා දෙන ලදී. නමුත් එම අවස්ථාවේදී උචිත වගා බිම් ඒ සඳහා භාවිතා නොවීමත්, එම කාලයේදී ගොවි මහතුන් මුහුණ දුන් ඉඩෝර තත්වයත් හේතුවෙන් මෙම ප්‍රභේදය ව්‍යාප්තිය මන්දගාමී විය. කෙසේ නමුත් උක් ගොවි මහතුන් කිහිප දෙනෙකු මෙම ප්‍රභේදය සමග රැළී සිටින අතර එහිදී නිරීක්ෂණය වූ සාපේක්ෂ වාසිදයක ලක්ෂණ හේතුවෙන් බොහෝ ගොවි මහතුන් මෙම ප්‍රභේදය කෙරෙහි නැවත යොමුවී ඇත.




## බිබිල ප්‍රදේශයට නව උක් කර්මාන්තායතනයක්

ශ්‍රී ලංකා සීනි කර්මාන්ත සංවර්ධනයේ නව බලාපොරොත්තු ඇති කරමින් දිනකට උක් ටොන් 4000ක් ඇඹරීමේ ධාරිතාවයෙන් යුත් උක් කර්මාන්තායතනයක් බිබිල ප්‍රදේශය තුල ඉදි කිරීමට රජයේ සහයෝගය යටතේ බිබිල සීනි සමාගම ඉදිරිපත් වී සිටී. මේ සම්බන්ධ පූර්ව යෝග්‍යතා අධ්‍යයනයන් බ්රෑකර්ස්ටේට් සමාගමේ තාක්ෂණික සහය ලබමින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය හා ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය විසින් සිදුකර ඇති අතර යෝග්‍යතා අධ්‍යයන කටයුතු ඉදිරියේදී සිදු කිරීමට නියමිතය.

## හිඟුරාන වැඩ අරඹයි

ශ්‍රී ලංකා සීනි කර්මාන්තය පසුබෑමකට ලක් කරමින් හා අම්පාර ප්‍රදේශයේ ගොවි පවුල් දහස් ගණනක් දැඩි දුෂ්කරතාවයන්ට පත් කරමින් වසර ගණනාවක් පුරා අත්හැරදමා තිබූ හිඟුරාන උක් කාර්මාන්තායතනය සීමාසහිත ගල් ඔය ප්ලාන්ටේෂන් සමාගම ලෙස නැවත වැඩ කටයුතු අරඹා ඇත. නව කර්මාන්තායතනය ඉදිරි වසර තුන තුල සීනි නිෂ්පාදනය ඇරඹීමට සැළසුම් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය උක් බිම් සංවර්ධනය සඳහා නිරෝගී බීජ උක් හා අනෙකුත් තාක්ෂණික කටයුතු සම්බන්ධයෙන් උක් පර්යේෂණ ආයතනයේ සහාය ලබා ගැනීමට නව පාලන අධිකාරිය දැනට පියවර ගෙන ඇති අතර, මූලික පියවරක් ලෙස උක් පර්යේෂණ ආයතනීය සභාපති තුමා, විධායක අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලය අගෝස්තු මාසයේදී එම ප්‍රදේශයට ගොස් කර්මාන්තායතනයේ වර්තමාන තත්වය අධ්‍යයනය කරන ලදී.


ගල්ඔය ප්ලාන්ටේෂන් සමාගම තුළ

## ගම නැගුමට උක් පර්යේෂණ ආයතනයේ දායකත්වය

ගම නැගුම වැඩ සටහන යටතේ තෝරා ගෙන ඇති සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මදුගම ග්‍රාම සේවා කොට්ඨාශයේ ග්‍රාමීය ජීවන තත්වය දියුණු කිරීම උදෙසා එම ප්‍රදේශයේ උක් ගොවි බිම් සංවර්ධනයට උක් පර්යේෂණ ආයතනයේ සහාය ලබා දීමට පියවර ගෙන ඇත. මේ සඳහා ගොවි පවුල් හඳුනා ගැනීම හා මූලික විස්තර සමීක්ෂණය මේ වන විට අවසන් කර ඇති අතර, ඒ අනුව ගොවි පවුල් 125ක් සඳහා නිරෝගී බීජ උක් සපයා දීමට අවශ්‍ය පියවර ගැනීමටත් උක් වගාකිරීම සම්බන්ධ තාක්ෂණික උපදෙස් හා පුහුණු කටයුතු මගින් සිය දායකත්වය ලබා දීමටත් උක් පර්යේෂණ ආයතනය සැළසුම් කර ඇත.

# වූල් කූඩිත්තා මර්දනයට පියවර රැසක්......

2006 මැද භාගයේ සිට වසංගත තත්වයෙන් උක් වගා ප්‍රදේශ ගණනාවක ව්‍යාප්ත වූ වූල් කූඩිත්තාගෙන් උක් වගාවන්ට වූ හානිය මැඩ පැවැත්වීමට සිදුවීම නොයෙකුත් බාධක මධ්‍යයේ උක් ගොවීන්ට මුහුණ දීමට සිදු වී ඇති විශාල අභියෝගයකි. මුලින්ම පස්සර, බඩල්කුඹුර ආදී ප්‍රදේශයන්හි වගාවන් විශාල වශයෙන් විනාශයට පත් කළ වූල් කූඩිත්තා ආක්‍රමණය, ක්‍රමක්‍රමයෙන් අනෙකුත් සියළුම උක් වගා ප්‍රදේශයන්හිද ව්‍යාප්තව පවතී.





**ක්‍රිප්ටොබ්ලැබස් සිටා (Cryptoblabes sita) නැමැති විලෝපිකයා ඇතුළු කෘමි ව්‍යාප්තිය පාලනය කිරීමට යොදා ගත හැකි ජීවීන්ගේ දැනට ඇති ගහණයන් වැඩිකර ගැනීම උදෙසා ගතයුතු පියවර අවධාරණය කරයි.**

මෙම වසංගත තත්වය හමුවේ උක් පර්යේෂණ ආයතනය මගින් මෙම කෘමි හානිය පිළිබඳව මූලික අධ්‍යයනයන් සිදුකර පාලනය සඳහා මූලික නිර්දේශ ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව පෝස්ටර්, උපදෙස් පත්‍රිකා හා සාකච්ඡා ආධාරයෙන් කෘමි වසංගත තත්වය පාලනය කිරීම සඳහා උක් කර්මාන්තායතනය හා ගොවීන්ගේ අවධානය හා අවබෝධය ඇතිකරවීමට පියවර ගෙන ඇත. වසංගත තත්වය පාලනය කිරීමේ පියවර යටතේ, කෘමි ව්‍යාප්තිය අධික වීම හේතුකොටගෙන කෙටිකාලීන හා ක්ෂණික ක්‍රියාමාර්ගයක් ලෙස රසානික මර්දන ක්‍රම නිර්දේශ කර ඇති අතර ඒ අනුව ගොවීන්හට කර්මාන්තායතන මගින් සපයන කෘෂි රසායන ද්‍රව්‍ය සඳහා වියදම් උක් පර්යේෂණ ආයතනය මගින් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර ඇත. කෙසේ නමුත් රසායන මර්දන ක්‍රම දිගුකාලීනව යොදා ගත හැකි ඵලදායී ක්‍රියාමර්ගයක් නොවන බැවින් උක් පර්යේෂණ ආයතනයේ පළිබෝධ පාලන අංශය මගින් ජෛව විද්‍යාත්මක පාලනය, වූල් කූඩිත්තාට ප්‍රතිරෝධී/ඔරොත්තු දෙන ප්‍රභේද හඳුනා ගැනීම ඇතුළු ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම පිළිබඳව අධ්‍යයනයන් හි යෙදෙන අතර, ඒ අනුව ඉදිරි නිර්දේශ ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත. දැනට කර ඇති අධ්‍යයනයන් අනුව, ජෛව විද්‍යාත්මක පාලනය යටතේ වූල් කූඩිත්තා මර්දනය සඳහා ක්‍රිප්ටොබ්ලැබස් සිටා (Cryptoblabes sita) නැමැති විලෝපික කෘමියා යොදා ගැනීමට හැකි බව හඳුනාගෙන ඇත. එම කෘමියා ඇතුළු වූල් කූඩිත්තා ව්‍යාප්තිය පාලනය කිරීමට යොදාගත හැකි ජීවීන්ගේ දැනට ඇති ගහණයන් වැඩිකර ගැනීම උදෙසා රසායනික මර්දනය අවම කිරීමේ වැදගත්කම පිළිබඳවත්, දේශගුනික සාධක වූල් කූඩිත්තාගේ ව්‍යාප්තිය කෙරෙහි ඇති කළ හැකි බලපෑම පිළිබඳවත්, ගොවි මහතුන් හා ව්‍යාප්ති නිළධාරීන් දැනුවත් කිරීමට උක් පර්යේෂණ ආයතනය පියවර ගෙන ඇත. දැනට මෙම විලෝපික කෘමීන්ගේ ගහනයන් වැඩි වෙමින් පවතින බැවින් කෘමිනාශක භාවිතය නැවත දැනුම්දෙන තුරු නතර කිරීමට පියවර ගන්නා ලෙස උක් කර්මාන්තායතන හා ගොවි මහතුන්ට උපදෙස් දී ඇත.

## නව උක් ප්‍රභේද ගොවිබිම තුළදී අධ්‍යයනයට ලක්වේ.

උක් අභිජනන වැඩසටහන යටතේ ඉදිරියේදී හඳුන්වා දීම සඳහා යෝග්‍ය බවට හඳුනාගෙන ඇති එස් එල් 92-4918 සහ එස් එල් 92 - 4997 ප්‍රභේද, ගොවි මහතුන්ගේ කළමනාකරණය යටතේ සෙවනගල ප්‍රදේශයේ තෝරා ගත් ගොවි බිම් වල අධ්‍යනයට ලක් කිරීමට උක් පර්යේෂණ ආයතනය කටයුතු ඇත. අදාල සියළු විෂයන් සම්බන්ධව පර්යේෂණ හා ව්‍යාප්ති නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් උචිත නව ප්‍රභේද හඳුනා ගැනීමේ පර්යේෂණයක් ලෙස ක්‍රියාත්මක කර ඇති මෙම අධ්‍යයනය උක් පර්යේෂණ ආයතනයේ, ශෂ්‍ය විද්‍යා, පළිබෝධ පාලන, ක්ෂුද්‍ර ජීව විද්‍යා, රසායන විද්‍යා හා ව්‍යාප්ති අංශ, උක් අභිජනන අංශයේ මූලිකත්වයෙන් මෙහෙයවයි. වාරිපෝෂිත තත්ව යටතේ වගා කෙරෙන හෙ: 0.75 ප්‍රමාණයේ වගාබිම් 10 ක් මේ සඳහා යොදා ගෙන ඇති අතර, දැනට සෙවනගල ප්‍රදේශයේ බහුල ලෙස වගා කරනු ලබන සී.ඕ 775 ප්‍රභේදය හා සම සමව නව ප්‍රභේද වගාකර සමාන කළමනාකරණ තත්ව යටතේ සී.ඕ 775 ප්‍රභේදය හා සංසන්ධනාත්මකව නව ප්‍රභේද වල ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කරයි. මෙම අධ්‍යයනයන්හි ප්‍රතිඵල මත අවශ්‍ය නිර්දේශ සමග මෙම වර්ග ඉදිරියේදී හඳුන්වා දීමට උක් පර්යේෂණ ආයතනය සැලසුම් කර ඇත.



අධ්‍යයනය සඳහා දායක වූ ගොවි මහතුන් සිය අස්වැන්න නෙළමින්

# උක් වගාවන් සඳහා නව පොහොර නිර්දේශයන්

උක් වගාවන් සඳහා පහත දැක්වෙන පොහොර නිර්දේශයන් උක් පර්යේෂණ ආයතනය මගින් උක් කර්මාන්තායතන සහ උක් ගොවීන් සඳහා සකස් කර ඇත. මේ සම්බන්ධව උක් කර්මාන්තායතන නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පසුගියදා උක් පර්යේෂණ ආයතනයේදී පැවති අතර එහිදී මෙම නිර්දේශයන් ඉදිරිපත් කළ උක් පර්යේෂණ ආයතනයේ රසායන විද්‍යා අංශයේ පර්යේෂණ නිලධාරී එන්.එස්. අබේසිංහ මහතා මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම මෙන්ම ප්‍රදේශ අනුව උක් බිම්වල පාංශු ගුණාංග වැඩි දියුණු කිරීමේ වැදගත්කම හා පාංශුඛාදනය වැළැක්වීමේ අවශ්‍යතාවයත් අවධාරණය කරන ලදි.

## සෙවනගල වර්ෂා පෝෂිත වගාවන් සඳහා

| වගාව | අස්වැන්න හෙ. 1 ට ටොන් | කාලය | ප්‍රමාණය හෙ. 1 ක් සඳහා කි. ග්‍රෑ | |
|---|---|---|---|---|
| | | | යූරියා | ටී. එස්. පී |
| පැල වගාව | 75 ට අඩු | සිටුවන අවස්ථාවේදී | 50 | 125 |
| | | සිටුවා සති 6-12 අතර | 125 | - |
| | 75 ට වැඩි | සිටුවන අවස්ථාවේදී | 75 | 175 |
| | | සිටුවා සති 6-12 අතර | 150 | - |
| නිරි වගාව | 75 ට අඩු | ඉපනැල්ල ශුද්ධකර සති 2-3 තුල | 100 | 125 |
| | | පැල වී සති 6-12 තුල | 100 | - |
| | 75 ට වැඩි | ඉපනැල්ල ශුද්ධකර සති 2-3 තුල | 125 | 175 |
| | | පැල වී සති 6-12 තුල | 150 | - |

## සෙවනගල වාරි පෝෂිත වගාවන් සඳහා

| වගාව | අස්වැන්න හෙ. 1 ට ටොන් | කාලය | ප්‍රමාණය හෙ. 1 ක් සඳහා කි. ග්‍රෑ | |
|---|---|---|---|---|
| | | | යූරියා | ටී. එස්. පී |
| පැල වගාව | 90 ට අඩු | සිටුවන අවස්ථාවේදී | 25 | 175 |
| | | සිටුවා සති 6 දී | 100 | - |
| | | සිටුවා සති 12 දී | 50 | - |
| | 90 ට වැඩි | සිටුවන අවස්ථාවේදී | 25 | 225 |
| | | සිටුවා සති 6 දී | 125 | - |
| | | සිටුවා සති 12 දී | 50 | - |
| නිරි වගාව | 90 ට අඩු | ඉපනැල්ල ශුද්ධකර සති 2-3 තුල | 25 | 175 |
| | | පැල වී සති 6 දී | 100 | - |
| | | පැල වී සති 12 දී | 75 | - |
| | 90 ට වැඩි | ඉපනැල්ල ශුද්ධකර සති 2-3 තුල | 50 | 225 |
| | | පැල වී සති 6 දී | 125 | - |
| | | පැල වී සති 12 දී | 75 | - |

## භාෂ්මික තත්වයට පත්වූ පස් සඳහා

| වගාව | අස්වැන්න හෙ. 1 ට ටොන් | කාලය | ප්‍රමාණය හෙ. 1 ක් සඳහා කි. ග්‍රෑ | | |
|---|---|---|---|---|---|
| | | | ඇමෝනියම් සල්ෆේට් | ටී.එස්.පී | එම්.ඕ.පී. |
| පැල වගාව | 75 ට අඩු | සිටුවන අවස්ථාවේදී | 50 | 200 | 25 |
| | | සිටුවා සති 6 දී | 225 | - | - |
| | | සිටුවා සති 12 දී | 125 | - | - |
| | 75 ට වැඩි | සිටුවන අවස්ථාවේදී | 75 | 250 | 50 |
| | | සිටුවා සති 6 දී | 250 | - | - |
| | | සිටුවා සති 12 දී | 175 | - | - |
| නිරි වගාව | 75 ට අඩු | ඉපනැල්ල ශුද්ධකර සති 2-3 තුල | 200 | 200 | 25 |
| | | පැල වී සති 6-12 අතර | 225 | - | - |
| | 75 ට වැඩි | ඉපනැල්ල ශුද්ධකර සති 2-3 තුල | 250 | 250 | 50 |
| | | පැල වී සති 6-12 දී | 275 | - | - |

පසේ ජෛව, රසායනික හා භෞතික ගුණාංග දියුණුකර පසේ සරුභ පවත්වාගෙන යාමටත්, එමගින් අස්වැන්න ඉහළ දැමීමටත්

- පස සේදීයාම අවම වන ලෙස බිම කළමනාකරණය කරමු
- අස්වනු නෙළීමෙන් පසු ඉතිරිවන උක් රොඩු වසුනක් ලෙස යොදමු
- නිර්දේශිත ප්‍රමාණයට පමණක් පොහොර යොදමු
- කෘමිනාශක හා වල් නාශක පසට එකතුවීම අවම කරමු
- පෙහන් මඩ, කොම්පෝස්ට් වැනි කාබනික ද්‍රව්‍ය වගා බිමට එක් කර
- නිරි වගාවන් ඉවත්කර නව වගාවන් සිටුවීම අතරතුර කාලයේදී රනිල බෝගයක් වවමු

## පැල්වත්ත රතු දුඹුරු පස් සඳහා

| වගාව | අස්වැන්න හෙ. 1 ට ටොන් | කාලය | ප්‍රමාණය හෙ. 1 ක් සඳහා කි. ග්‍රෑ | | |
|---|---|---|---|---|---|
| | | | යූරියා | ටී.එස්.පී | එම්.ඕ.පී. |
| පැල වගාව | 75 ට අඩු | සිටුවන අවස්ථාවේදී | 25 | 200 | 25 |
| | | සිටුවා සති 6 දී | 75 | - | - |
| | | සිටුවා සති 12 දී | 25 | - | - |
| | 75 ට වැඩි | සිටුවන අවස්ථාවේදී | 25 | 250 | 50 |
| | | සිටුවා සති 6 දී | 100 | - | - |
| | | සිටුවා සති 12 දී | 75 | - | - |
| නිරි වගාව | 75 ට අඩු | ඉපනැල්ල ශුද්ධකර සති 2-3 තුල | 75 | 200 | 25 |
| | | පැල වී සති 6-12 අතර | 75 | - | - |
| | 75 ට වැඩි | ඉපනැල්ල ශුද්ධකර සති 2-3 තුල | 110 | 250 | 50 |
| | | පැල වී සති 6-12 අතර | 115 | - | - |

## පැල්වත්ත අනෙකුත් පස් වර්ග සඳහා

| වගාව | අස්වැන්න හෙ. 1 ට ටොන් | කාලය | ප්‍රමාණය හෙ. 1 ක් සඳහා කි. ග්‍රෑ | | |
|---|---|---|---|---|---|
| | | | යූරියා | ටී.එස්.පී | එම්.ඕ.පී. |
| පැල වගාව | 75 ට අඩු | සිටුවන අවස්ථාවේදී | 25 | 200 | 25 |
| | | සිටුවා සති 6 දී | 75 | - | - |
| | | සිටුවා සති 12 දී | 50 | - | - |
| | 75 ට වැඩි | සිටුවන අවස්ථාවේදී | 25 | 250 | 50 |
| | | සිටුවා සති 6 දී | 125 | - | - |
| | | සිටුවා සති 12 දී | 75 | - | - |
| නිරි වගාව | 75 ට අඩු | ඉපනැල්ල ශුද්ධකර සති 2-3 තුල | 75 | 200 | 25 |
| | | පැල වී සති 6-12 අතර | 100 | - | |
| | 75 ට වැඩි | ඉපනැල්ල ශුද්ධකර සති 2-3 තුල | 125 | 250 | - |
| | | පැල වී සති 6-12 අතර | 125 | - | 50 |

(සියළුම වගාවන් සඳහා උක් බිමෙන් ලැබූ අවසන් අස්වැන්නේ ප්‍රමාණය අනුව වෙන් වෙන් වශයෙන් නිර්දේශයන් දක්වා ඇති අතර මෙම නිර්දේශයන් සම්බන්ධ සියළුම කරුණු උක් පර්යේෂණ ආයතනය විසින් නිකුත් කර ඇති උක් වගාව සඳහා පොහොර යෙදීම අත් පත්‍රිකාවේ දක්වා ඇත.)

# උක් සිටුවීමේ ලාභදායක ක්‍රමයක් හඳුන්වා දෙයි



**හෙක්ටයාරයකට බීජ උක් ටොන් දෙකකටත් අඩුවෙන් භාවිතා කර දැනට සිටුවන ක්‍රමයෙන් ලබා ගන්නා උක් අස්වැන්නම ලබා ගැනීමට හැකි ක්‍රමයක් ලෙස උක් පර්යේෂණ ආයතනය පරතරයක් ඇතිව උක් දඬු සිටුවීමේ තාක්ෂණය හඳුන්වා දී ඇත. දැනට සිටුවීම සඳහා හෙක්ටයාරයකට බීජ උක් ටොන් 8-10 අතර භාවිතා කරන බැවින් නව ක්‍රමයෙන් බීජ උක් වියදම 75% න් පමණ අඩුකරගත හැක.**

නව උක් සිටුවීමේ ක්‍රමය පළිබඳව උක් කර්මාන්තායතන නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සැප්තැම්බර් 13 දින උක් පර්යේෂණ ආයතනයේදී පැවති අතර එම අවස්ථාවට සෙවනගල, පැල්වත්ත, හා ගල්ඔය උක් කර්මාන්තායතන නියෝජනය කරමින් නිළධාරී මහතුන් 40 ක් පමණ සහභාගී විය. දිගු කාලයක් තුළ උක් අභිජනන අංශයේ ප්‍රධාන පර්යේෂණ නිළධාරී අරුණ විජේසූරිය මහතා හා පර්යේෂණ නිළධාරිණී සන්ධ්‍යා ආරියවංශ මහත්මිය ඇතුළු කාර්ය මණ්ඩලය විසින් නෙර අතර හා නෙර තුල විවිධ පරතර යොදා ගනිමින් කරන ලද පර්යේෂණ අනුව මීටර් 1.75 ක නෙර අතර පරතරය දක්වා පරාසය තුල නෙරය තුල මීටරයක පරතරයක



නව ක්‍රමය



දැනට පවතින ක්‍රමය

පුඳුරු දෙකක් වර්ධනය කර ගැනීමෙන් දැනට ලබන උක් අස්වැන්නම ලබගත හැකි බව තහවුරු වී ඇත. මෙම ක්‍රමයේදී පළමුවෙන්ම අංකුර දෙකේ උක් කැබලි දිලීර නාශක අඩංගු ජලයේ පොඟවා ඉවතට ගෙන තෙතමනය රැකෙන පරිදි ආවරණය කර පැය 36ක් තැබීමෙන් අංකුර හා මුල් වර්ධනය උත්තේජනය කර පැළ ලබා ගැනීමේ හැකියාව සහතික කර ගනී. ඉන් අනතුරුව නෙරයේ මීටරයක පරතරයක් තුල පැල දෙකක් ලබා ගැනීමට හැකි වන ලෙස පරතරයක් ඇතිව උක් දඬු කැබලි සිටුවා සාමාන්‍ය වගාවක් පරිදි නඩත්තු කළ යුතුය. මුලින් සාමාන්‍ය වගාවක තරම් පැළ ගහණයක් නැති සේ දිස් වුවත් මාස 2 - 2 1/2 වන විට එම තත්වය වෙනස් වී සාමාන්‍ය වගාවක මට්ටමට පැමිණේ.

1 වන පිටුවෙන්.......**බීජ උක් උණුදිය ප්‍රතිකාර කිරීමට වැඩි ධාරිතාවයෙන් යුත් යන්ත්‍රයක්**

මෙතෙක් උක් පර්යේෂණ ආයතනය සතුව පැවතියේ එහි ඉංජිනේරු අංශය විසින් නිපදවා තිබූ දිනකට උක් ටොන් 1/4 ක් පමණ ප්‍රතිකාර කළ හැකි විද්‍යාගාර මට්ටමේ කුඩා යන්ත්‍රයක් හා එය තවදුරටත් දියුණු කර නිපදවූ දිනකට උක් ටොන් 1ක් පමණ ප්‍රතිකාර කළ හැකි යන්ත්‍රයත්. මෙම යන්ත්‍ර වල උෂ්ණත්වය නිසි ලෙස පාලනය කළ හැකිමුත් ධාරිතාවය අඩුවීම හා කම්කරු අවශ්‍යතාවය වැඩිවීම නිසා ආයතනයේ මෙන්ම සීනි සමාගම් වල අවශ්‍යතාවයන්ට අනුව බීජ උක් නිපදවීම කළ නොහැකි විය.

ස්වයංක්‍රීය මෙහෙයුම් පද්ධතියක් මගින් උෂ්ණත්ව පාලනය හා ජල සැපයුම හැසිරවීම නිසාත්, බීජ උක් දඬු පිරවූ කූඩ යන්ත්‍රය තුළට ඇතුල්කරවීම හා ඉවත් කිරීමේ කටයුතු දුරස්ත පාලකයක් මගින් මෙහෙයවීමට හැකිලෙස නිර්මාණය කිරීමත් හේතුවෙන් නව උණුදිය ප්‍රතිකාර යන්ත්‍රය ක්‍රියකරවීම කම්කරුවන් දෙදෙනෙකුට පමණක් සිදුකළ හැක. එසේම උණුදිය ප්‍රතිකාරයට ලක් කළ බීජ උක් ට්‍රැක්ටර් ට්‍රේලරය මතටම ගැනීමට හැකිවීමත් මෙහි ඇති විශේෂිත ලක්ෂණයන් වේ. මෙම යන්ත්‍රය මගින් බීජ උක් ටොන් 1ක් ප්‍රතිකාර කිරීමට රු. 1000 ක් පමණ වැයවන අතර ඉන් 40% ක්ම විදුලිය සඳහා වියදම් වේ. මෙම වියදම අඩුකර ගැනීමේ මාර්ගයක් වශයෙන් මුලින් ජලය රත්කර ගැනීම සඳහා සූර්ය තාපය භාවිතා කළ හැකි ලෙස මෙය නිර්මාණය කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය අනෙකුත් කටයුතු දැනට සිදු කෙරේ. එසේම උක් සමාගම තුළ මෙය සවිකිරීමේ මූලික ජලය රත්කර ගැනීමේ කාර්ය සඳහා විදුලිය වෙනුවට හුමාලය යොදා ගත හැකි වීමද මෙහි ඇති විශේෂත්වයකි.

ඉදිරියේදී සියඹලාණ්ඩුව ඇතුළු ප්‍රදේශ කිහිපයක මෙම යන්ත්‍ර ස්ථාපනය කර නිරෝගී බීජ උක් නිපදවීමේ කටයුතු කාර්යක්ෂම කිරීමට උක් පර්යේෂණ ආයතනය බලාපොරොත්තු වේ.

## ආයතන තොරතුරු

### උක් පර්යේෂණ ආයතනයේ නව පත්‍රිකා

පහත දක්වා ඇති පත්‍රිකා මුද්‍රණය කර කර්මාන්තායතන, ගොවි මහතුන් හා උක් වගා කටයුතු සම්බන්ධව උනන්දුවක් දක්වන අය සඳහා ලබා දීමට පියවර ගෙන ඇත.

1. SRI BROCHURE
2. උක් හකුරු සහ පැණි නිපදවීම.
3. උක් වගාවේ පළිබෝධකයෝ: වූල් කූඩිත්තා
4. උක් වගාව සඳහා පොහොර යෙදීම.

### සෙවනගල ක්ෂේත්‍ර නිළධාරීන් සඳහා සහතික පත්‍ර පාඨමාලාවක්

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ ඉල්ලීමක් මත උක් පර්යේෂණ ආයතනය මගින් සෙවනගල සීනි සමාගමේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පවත්වන මාස 6ක උක් වගාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 2007 සැප්තැම්බර් 8 දින සිට සෙවනගල උක් සමාගම් පරිශ්‍රය තුළ පැවැත්වේ. මේ සඳහා සෙවනගල උක් සමාගම් ක්ෂේත්‍ර නිළධාරී මහත්ම මහත්මීන් 22 දෙනෙක් සහභාගී වේ.

# උක් සහ සීනි නිෂ්පාදනය පිළිබඳ වර්තමාන තොරතුරු

### දේශීය සීනි නිෂ්පාදනය, සීනි ආනයන ප්‍රමාණ,ආනයන වියදම හා ඒක පුද්ගල සීනි පරිභෝජනය

| අවුරුද්ද | දේශීය නිෂ්පාදනය (මෙ.ටො) | ආනයන ප්‍රමාණය (මෙ.ටො) | ආනයන වියදම (රු. මිලියන) | ඒක පුද්ගල පරිභෝජනය (කි.ග්.) |
|---|---|---|---|---|
| 2000 | 64000 | 562000 | 10777 | 32.38 |
| 2001 | 48000 | 420000 | 10289 | 33.18 |
| 2002 | 38000 | 554000 | 12634 | 34.12 |
| 2003 | 57000 | 509000 | 11199 | 34.82 |
| 2004 | 58000 | 438000 | 11048 | 35.12 |
| 2005 | 54000 | 418000 | 13303 | - |
| 2006 | 56000 | 525000 | 23256 | - |

(දත්ත මූලාශ්‍රයන් : ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා, F.O.Lichts statictis, සෙවනගල හා පැල්වත්ත උක් කර්මාන්තායතන)

### පැල්වත්ත සීනි කර්මාන්තයේ උක් වගා දත්ත 2005/2006

උක් වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර)

| | |
|---|---|
| කේන්ද්‍රීය | 1,670 |
| ජනාවාස | 3,250 |
| පිටස්තර ගොවි | 5,972 |
| ඒකාබද්ධ උක් ගොවි සංවිධානය | 506 |

අස්වැන්න නෙලූ බිම් ප්‍රමාණය (හෙක්ටයාර)

| | |
|---|---|
| කේන්ද්‍රීය | 1,476 |
| ජනාවාස | 2,318 |
| පිටස්තර ගොවි | 5,500 |
| ඒකාබද්ධ උක් ගොවි සංවිධානය | 461 |

| | |
|---|---|
| මුළු උක් නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | 4,73,299 |
| ජනාවාස | 1,32,536 |
| පිටස්තර ගොවි | 2,32,559 |
| හිඟුරාන | 11,908 |
| සෙවනගල | 1,823 |
| ඒකාබද්ධ උක් ගොවි සංවිධානය | 23,958 |

සාමාන්‍ය උක් අස්වැන්න (හෙක්ටයාරයට මෙට්‍රික් ටොන්) 47

| | |
|---|---|
| කේන්ද්‍රීය | 45.00 |
| ජනාවාස | 56.00 |
| පිටස්තර ගොවි | 42.00 |
| ඒකාබද්ධ උක් ගොවි සංවිධානය | 52.00 |
| සීනි නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | 39.141 |
| සීනි උකහා ගැනීම (%) | 8.28 |

### ශ්‍රී ලංකාවට සීනි ආනයනය (2006)

| ආනයනය කළ රට | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) |
|---|---|
| යුරෝපා කොමිසම | 2,40,646 |
| ස්විට්ස්සර්ලන්තය | 71,299 |
| ඉන්දියාව | 66,092 |
| බ්‍රසීලය | 59,072 |
| සිංගප්පූරුව | 39,422 |
| තායිලන්තය | 25,177 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 8,374 |
| ඇමරිකා එක්සත් ජනපදය | 2,664 |
| කොළොම්බියා | 1,959 |
| අනෙකුත් රටවල් | 4,197 |
| එකතුව | 5,14,895 |

(දත්ත මූලාශ්‍රයන් : world sugar year book)

### සෙවනගල සීනි කර්මාන්තයේ උක් වගා දත්ත 2005/2006

උක් වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර)

| | |
|---|---|
| වාරි පෝෂිත | 1,445 |
| වර්ෂා පෝෂිත | 2,086 |
| කේන්ද්‍රීය | 203 |

ඇඹරූ උක් ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)

| | |
|---|---|
| වාරි පෝෂිත | 1,55,026 |
| වර්ෂා පෝෂිත | 1,51,926 |
| කේන්ද්‍රීය | 19,943 |

| | |
|---|---|
| මුළු උක් නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | 1,89,996 |

සාමාන්‍ය උක් අස්වැන්න (හෙක්ටයාරයට මෙට්‍රික් ටොන්)

| | |
|---|---|
| වාරි පෝෂිත | 91.47 |
| වර්ෂා පෝෂිත | 72.20 |
| පිටස්තර ගොවි | 68.23 |
| සීනි නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | 14,612 |
| සීනි උකහා ගැනීම (%) | 8.15 |
| මුළු ඉක්ෂුපාක නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | 7959 |
| මුළු ස්ප්‍රීතු නිෂ්පාදනය (ලීටර්) (Bulk ltrs) | 2,04,3028 |

දත්ත මූලාශ්‍රයන්: පැල්වත්ත සීනි සමාගම හා සෙවනගල සීනි සමාගම

### තෝරාගත් රටවල් කිහිපයක සීනි මිල

| රට | කිලෝ ග්‍රෑම් එකක සිල්ලර මිල රු. | රට | කිලෝ ග්‍රෑම් එකක මිල සිල්ලර මිල රු. |
|---|---|---|---|
| ජපානය | 186.34 | පකිස්ථානය | 72.60 |
| තුර්කිය | 164.56 | ඉන්දුනීසියාව | 67.76 |
| ඇමරිකා එක්සත් ජනපදය | 106.48 | පිලිපීනය | 58.08 |
| ඕස්ට්‍රේලියාව | 104.06 | ශ්‍රී ලංකාව | 50.00 |
| කැනඩාව | 101.64 | බ්‍රසීලය | 48.40 |
| මෙක්සිකෝව | 101.64 | ඉන්දියාව | 43.56 |
| කොළොම්බියාව | 79.86 | තායිලන්තය | 38.72 |
| රුසියාව | 77.44 | මුරුසිය | 14.52 |
| දකුණු අප්‍රිකාව | 75.02 | | |

(ඇමරිකන් ඩොලර් 1ක් = රුපියල් 110 ලෙස ගෙන මිල පරිවර්තනය සිදුකර ඇත.)
Source: International Sugar Journal 2007, Vol 109, No 1304

# උක් කර්මාන්තයට නව ජවයක් විකල්ප බල ශක්තියක් ලෙස එතනෝල්

**පසුගිය දස වසර තුළ පමණක් අමුතෙල් මිල 300%න් පමණ ඉහල ගොස් ඇත. මෙසේ දිනෙන් දින ඉහළ යන පොසිල ඉන්ධන මිළ නැවත නැවත අලුතින් ලබාගත හැකි (Renewable) බලශක්ති ප්‍රභවයන් පිළිබඳව ලෝකය තුළ පවතින වාද විවාද ගින්න අවුලවන්නට නොකඩවා වැටෙන ඉන්ධනයක් බවට පත්ව ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ලෝකය තුළ ඉන්ධන-එතනෝල් (Fuel Ethanol) නිෂ්පාදනයට වඩාත්ම වැදගත් පෝෂක සැපයුමක් (Feedstock) ලෙස උක් හා බඩඉරිඟු වල වටිනාකම කැපී පෙනෙන ස්ථාවර තත්වයකට ගෙනවිත් ඇත.**

සීනි අඩංගු ආහාර ද්‍රව්‍ය වන උක්, බඩඉරිඟු, සෝගම්, තිරිඟු හා පලතුරු ආදිය පැසවා ආසවනය කිරීමෙන් එතනෝල් නිපදවාගත හැකි අතර, එය පෙට්‍රල් (ගැසොලින්) හා සසඳන කළ අහිතකර ද්‍රව්‍ය පරිසරයට මුදාහැරීම අඩු පිරිසිදු ඉන්ධනයක් වේ.එතනෝල් මගින් වැඩි ඔක්ටේන් ප්‍රමාණයක් අඩු මුදලකට නිපදවෙන අතර එහි ඇති වැඩි ඔක්ෂිජන් ප්‍රමාණය නිසා අනෙකුත් ඉන්ධන වලට වඩා අඩු කාබන් මොනොක්සයිඩ් ප්‍රමාණයක් පරිසරයට මුදා හරී. එබැවින් එතනෝල්- ගැසොලීන් මිශ්‍රණ මගින් ක්‍රියා කරන වාහන භාවිතය තුලින් ඕසෝන් ස්ථරයට හානිදායක හායිඩ්‍රො කාබන් නිකුත්වීමද අඩු කළ හැක.

ජනගහනය වැඩිම මහද්වීපය වන ආසියාව තුල අවුරුදු 10කට පෙර තත්වය හා බලන කල අද වන විට ජෛව ඉන්ධන ශක්තිමත් ලෙස මුල් බැස ගනිමින් පවතී. ශක්තිමත් ආර්ථික වර්ධනයන් සමග ජීවන තත්වය ඉහල යාමත් ඒ අනුව ඒක පුද්ගල, පරිසර හානිය අඩු බල ශක්ති (clean energy) ඉල්ලුම ඉහලයාමත් මෙම වර්ධනයන්ට පාදකව ඇත. එසේම ඇමරිකන් මහද්විපය තුලත් නැගෙනහිර හා දකුණු දිග අප්‍රිකාව තුලත් ඉන්ධන ලෙස එතනෝල් නිෂ්පාදන ව්‍යාප්තිය වැඩිවී ඇත. යුරෝපා හවුල තුළ 2010 වන විට ජෛව ඉන්ධන සඳහා වෙළඳ පොළ අනුපාතය 6% ක් පමණ ඉලක්ක වී ඇත. යුක්රේනය හා රුසියාව තුළද ජෛව ඉන්ධන වැඩසටහන් කරා යාම දැකිය හැකි අතර, මැදපෙරදිග රටවල ඒ සඳහා වෙළඳ පොළ අනුපාතයද කැපී පෙනෙන ඉහළයාමක් පෙන්නුම් කරයි.

පසුගිය කාලය සැලකීමේදී,විශේෂයෙන් 2005/2006 වර්ෂයන්හිදී ජෛව ඉන්ධන ක්ෂේත්‍රයට අදාලව කැපී පෙනෙන සංවර්ධනයන් ගණනාවක්ම දැකිය හැක. මේ අතරින් ඇමරිකාව තුළ  නැවත නැවත අලුතින් ලබාගත හැකි ඉන්ධන සම්මතයන් (RFS - Renewble Fuel Standerds) භාවිතයට පැමිණීම, 2003 දී බ්‍රසීලය තුළ නිපදවූ විවිධ පෙට්‍රල් හා එතනෝල් අනුපාත මිශ්‍රණයකින් ක්‍රියාකළ හැකි වාහන තැනීමේ තාක්ෂණික විප්ලවය, ඉන්දියාවේ ඉන්ධන එතනෝල් වැඩසටහන් නැවත ඇරඹීම, විශේෂිත වේ. මේ හැරුණු විට පිලිපීනය හා ඉන්දුනීසියාව තුළ එතනෝල් සම්බන්ධව නීති සම්පාදනය හා භාවිතය, තායිලන්ත ඉන්ධන වෙළඳපොළ තුළ නැගී එන කාර්යභාරය, හා යුරෝපා හවුල තුළ ජෛව ඉන්ධන මගපෙන්වීම් භාවිතා වීමද සැලකිය යුතු සංවර්ධනයන්ය. එසේම ඉදිරි අවුරුදු 07 තුළ ඇමරිකාව සිය එතනෝල් භාවිතය ලීටර් බිලියන 30ක් දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇත. ලෝකය තුළ කෙටිකාලීන හා මධ්‍ය කාලීන ඉල්ලුම හා මිල තීරණය වීමේදී ප්‍රධාන රටවල් වන බ්‍රසීලය හා ඇමරිකාවේ එතනොල් නිෂ්පාදනය හා පරිභෝජනය ප්‍රධාන වේ. ඒ අනුව 2005 සහ 2008 කාලයේදී කර්මාන්තයේ ධාරිතාවය ලීටර් බිලියන 4 ඉක්මවනු ඇති අතර වේගයෙන් වැඩිවන පරිභෝජනය හේතුවෙන් එතනෝල් සඳහා වැඩිවන ඉල්ලුම් තත්වය තුළ එතනොල් මිල 2005 මට්ටමට, එනම් කියුබික් මීටර් 1 ක් ඩොලර් 450 ත් 500 ත් මට්ටමට ඉදිරියේදී අඩුවනු ඇත.

ආසියාව සැලකීමේදී පෝෂක සැපයුමක් ලෙස උක් කර්මාන්තය සෑහෙන ප්‍රමාණයකට ඇති දකුණු ආසියාව තුළ එතනෝල් මූලික සංවර්ධන ආරම්භයන් කේන්ද්‍රගතවී ඇත. තායිලන්ත රජය 95 ඔක්ටේන් ගැසොලින් ක්‍රමක්‍රමයෙන් අඩුකිරීමට පෙට්‍රල් එතනෝල් මිශ්‍රණ (Gashol) භාවිතය වැඩි කිරීම, ඉන්දියාව තුළ ඉන්ධන මධ්‍යසාර කර්මන්තය නැවත පණගැන්වීම තුළින් එතනෝල් ඉල්ලුම ලීටර් මිලියන 500 ක් පමණ වීම,හා 2010 වන විට ජපානය තුළ එතනෝල් ඉල්ලුම ලීටර් මිලියන 300 ත් 400 ත් පමණ වීම ආසියාව තුළ දැකිය හැකි වර්ධනාත්මක තත්වයන්ය. ආසියාවේ ඉහළම පෙට්‍රල් පරිභෝජනය ඇති රටවල් වනුයේ ජපානය, චීනය, ඉන්දුනීසියාව හා ඉන්දියාවයි. ඉතා ස්වල්ප රටවල් ප්‍රමාණයක් ලීටර් බිලියන 10 ට අඩු මට්ටමක පවතී. සංවර්ධන වේගය අනුව ආසියාව තුළ ඉදිරියෙන්ම සිටින වියට්නාමය, ඉන්දියාව, චීනය, මැලේසියාව හා ඉන්දුන්සියාව ඇතුළු රටවලට උපක්‍රමික වශයෙන් ඉන්ධන එතනෝල් රටතුළ නිපදවා ගැනීම හෝ ආනයනය කිරීම වැදගත් වනු ඇත. මේ අනුව ආසියාව තුළ ඉන්ධන එතනෝල් නිෂ්පාදන හා ආනයන වෙළඳපොළ සඳහා විශාල විභවයක් පවතී.

ලෝකයේ අනෙකුත් රටවල තත්වය මීට වෙනස්ය. මෙතෙක් වැඩිම පෙට්‍රල් පරිභොජනය ඇමරිකාව (ලීටර් බිලියන 500) වන අතර බිලියන 30 ට වැඩි පර්භෝජනයක් පෙන්වන රටවල් ගොන්නට කැනඩාව, මෙක්සිකෝව හා ජර්මනිය අයත් වේ. මේ හේතුවෙන් දැනටමත් ඉන්ධන එතනෝල් ව්‍යාපෘති අරඹා ඇති මෙම රටවල වෙළඳපොළවල විශාලත්වය ආසියාවට වඩා වැඩිය. නමුත් වෙළඳපොළ ව්‍යුහාත්මකව වෙනස් වෙමින් පවතින අතර පසුගිය අවුරුදු කීපයේදී යුරෝපා හවුල තුළ පෙට්‍රල් පරිභෝජනය අඩුවීමක් පෙන්වන අතර ඇමරිකාව හා කැනඩාව තුළ පරිභෝජනය සුළු වර්ධනයක් පැවතියත් ආසියාව තුළ පවතින 2% වර්ධනයට සාපේක්ෂව අඩු මට්ටමක පවතී. මේ තත්වයන් තුළ පැහැදිලිවම දැනට බටහිර අර්ධගෝලය තුළ පවතින තත්වය ඉදිරි අවුරුදු 10 තුළ ආසියාව තුළ ඇතිවන අතර එතනෝල් හා පෙට්‍රල් පරිභෝජනය අතින් ආසියාව බටහිර මට්ටමට පැමිණෙනු ඇත.

මේ අනුව රටවල් වැඩි ප්‍රමාණයක් සම්පූර්ණයෙන්ම තරඟකාරී මට්ටමකින් සිය නිෂ්පාදනයන් පවත්වාගෙන යන උක් කර්මාන්තය ආශ්‍රිත එතනොල් නිෂ්පාදන තවදුරටත් පුළුල්වීමට ඇති තරම් අවකාශයක් පවතී. නමුත් මෙම රටවල් අතුරින් බොහොමයක් ප්‍රමාණයෙන් කුඩා, සංවර්ධනය වෙමින් පවතින ඒවා වන අතර ජෛව එතනෝල් වැඩසටහන් සඳහා ආයෝජනය කිරීමට අඩු හැකියාවක් පවතී. මෙම රටවල ජෛව ඉන්ධන වැඩසටහන් ඉදිරියට ගෙනයාමට නිෂ්පාදන ධාරිතාවයන් ඉහළ දැමීම හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විශාල ආයෝජනයන් සිදුවිය යුතුය. F.O. Licht මගින් ලෝකයේ බොහෝ රටවල් සම්බන්ධයෙන් ගොනුකර ඇති දත්ත වලට අනුව කෘෂිකාර්මික දෘෂ්ඨි කෝණයෙන් බලන කළ එතනෝල් කර්මාන්තය පුළුල් ලෙස වැඩි දියුණු වීමේ විශාල ඉඩකඩක් පවතී. කෙසේ නමුත් මේ සම්බන්ධයෙන් ඇති ආයතනීය හා යටිතල පහසුකම් වැනි බාධක ජයගැනීම උදෙසා ඉදිරි වසර කිහිපය තුළ විශාල වශයෙන් ආයෝජනයන් සිදුවිය යුතුය. මෙම අඩුලුහුඩුකම් පැවතියත් බොහෝ රටවල් ඉදිරියේදී තම ජෛව ඉන්ධන වැඩසටහන් ඇරඹීමත් සමග ඉදිරි වසර 15 තුළ ඉන්ධන එතනෝල් නිෂ්පාදනය බල සම්පන්න ලෙස වර්ධනය වීමක් පෙන්නුම් කරයි. මධ්‍යස්ථ ප්‍රක්ෂේපිත ඇස්තමේන්තු වලට අනුව 2020 දී ලෝක පෙට්‍රල් වෙළඳ පොළේ 6% පමණ එතනෝල් වලට හිමිවනු ඇති අතර මෙම කාලවකවානුව වන විට අනිවාර්යෙන්ම එතනෝල් සත්‍ය ලෙසම ලෝක පරිභෝජන ද්‍රව්‍යයක් වනු ඇත. එනමුත්, වර්ථමාන තත්වය හා බලනවිට මෙම තත්වය ඊට පෙර වුවද උදාවීමේ ඉඩකඩක් පවතී.

(Christoph Berg විසින් WORLD SUGAR YEAR BOOK 2007 හි පළ කල අදහස් ආශ්‍රයෙන් සකසන ලදි - සංස්කාරක, පුවත් හසුන.

# වයඹ පළාත් සභාවෙන් උක් ආශ්‍රිත ග්‍රාමීය ව්‍යාපෘතියක්...

**උක් ආශ්‍රිත කුඩා පරිමාන ව්‍යවසායකයන් බිහිකිරීමේ අරමුණින් වයඹ පළාත තුළ ග්‍රාමීය, උක් වගා ව්‍යාපෘතියක් ඇරඹීමට වයඹ පළාත් සභාවේ ඉඩම්, කෘෂිකර්ම, වාරිමාර්ග හා සත්ව නිෂ්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යංශය මගින් පියවර ගෙන ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා උක් පර්යේෂණ ආයතනයෙන් තාක්ෂණික උපදෙස් හා මූලික තවාන් සඳහා අවශ්‍ය බීජ උක් ලබා ගැනීමට සැලසුම් කර ඇත.**

2005 වසරේදී, එවකට වැවිලි කර්මාන්ත අමාත්‍යව සිටි අනුර ප්‍රියදර්ශන මැතිතුමාගේ උපදෙස් මත වයඹ පළාත තුල උක් වගාව ප්‍රචලිත කිරීම සඳහා උක් පර්යේෂණ ආයතනය මගින් පන්නල, කුලියාපිටිය හා හෙට්ටිපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් හි උක් වගාවන් මුලින්ම පටන් ගන්නා ලදි. එම වගාවන්ගෙන් ලබා ගන්නා බීජ උක් නව ව්‍යාපෘතියේ මූලික තවාන් සඳහා ලබා දෙමින් වයඹ පළාත තුළ තව දුරටත් උක් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා උක් පර්යේෂණ ආයතනය සිය දායකත්වය ලබා දීමට කටයුතු කරයි.

මෙම උක් වගා ව්‍යාපෘතියෙන් වගා කටයුතු ඇරඹීම සම්බන්ධ ප්‍රථම ගොවි හමුව නිකවැරටිය මැතිවරණ කොට්ඨාෂයේ දිවුල්ලෑව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර කාර්යාලයේදී 2007 ජූලි 30 දින වයඹ පළාත් සභාවේ ඉඩම්, කෘෂිකර්ම, වාරිමාර්ග හා සත්ව නිෂ්පාදන කටයුතු පිළිබඳ අමාත්‍ය ආර්.ඩී. විමලදාස මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විනි. තෝරාගත් ගොවීන්ට ව්‍යාපෘතිය සම්බන්ධ මූලික උපදෙස් ලබාදීම සහ ඉදිරි පියවර පිළිබඳ සාකච්ඡා කිරීමේ අරමුණින් සංවිධානය කර තිබූ මෙම අවස්ථාවට උක් පර්යේෂණ ආයතනයේ හා පළාත් කෘෂිකර්ම අමාත්‍යංශයේ නිළධාරීන්ද සහභාගී විය.



වයඹ පළාත් සභාවේ ඉඩම් කෘෂිකර්ම, වාරිමාර්ග හා සත්ව නිෂ්පාදන කටයුතු පිළිබඳ අමාත්‍ය ආර්.ඩී.විමලදාස මහතා හා අමාත්‍යංශ ලේකම් මහතා ඇතුළු නිලධාරීන් ගොවි මහතුන් සමග කෙෂ්ත්‍ර වැඩසටහනට එක්වෙමින්.



ප්‍රථම ගොවි හමුව නිකවැරටිය මැතිවරණ කොට්ඨාශයේ දිවුල්වැව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර කාර්යාලයේ වයඹ පළාත් සභාවේ ඉඩම්,කෘෂිකර්ම, වාරිමාර්ග හා සත්ව නිෂ්පාදන කටයුතු පිළිබඳ අමාත්‍ය ආර්.ඩී.විමලදාස මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අවස්ථාව.

මෙම ව්‍යාපෘතිය පළමු අදියරේදී, තොරාගත් ගොවී මහතුන් 30 දෙනෙකුට (එක් අයකුට අක්කර 1/2 ක් සඳහා) බීජ උක් සැපයීමටත් දෙවන පියවර යටතේ පළමු ගොවි කණ්ඩායමේ අස්වනු බීජ උක් ලෙස ගෙන තවදුරටත් උක් වගාවන් ව්‍යාප්ත කර උක් හකුරු නිපදවීමේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය උක් සැපයුම් ඇති කිරීමටත් සැලසුම් කර ඇත. මෙම වැඩසටහන සඳහා මූලික සැලසුම් සැකසීමට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා ගැනීමට පළාත් කෘෂිකර්ම අමාත්‍ය නිළධාරීන් සඳහා එක්දින වැඩමුළුවක් පසුගිය ජූලි මාසයේදී උඩවලව උක් පර්යේෂණ ආයතනයේදී පැවැත්වුනි.

ඉන් අනතුරුව තෝරාගත් ගොවි මහතුන් සඳහා උක් පර්යේෂණ ආයතනය විසින් උක් වගා කටයුතු පිළිබඳ කෙෂ්ත්‍ර දිනයක් සංවිධානය කර තිබූ අතර උඩවලවේ පැවති මෙම අවස්ථාවට එක් වූ වයඹ පළාත් සභාවේ ඉඩම්, කෘෂිකර්ම, වාරිමාර්ග හා සත්ව නිෂ්පාදන කටයුතු පිළිබඳ අමාත්‍ය ආර්.ඩී. විමලදාස මහතා හා අමාත්‍ය ලේකම් ආර්.ඒ. තිලකරත්න මහතා ඇතුළු නිලධාරීන් ගොවි මහතුන් සමග එක්ව ඔවුන් දිරිමත් කරමින් එම වැඩසටහනට ක්‍රියාකාරීව දායක විය.


**විෂය උපදේශකත්වය**

ආචාර්ය සී.එස්. වීරරත්න
ආචාර්ය එච්.කේ. සුනිල්
අරුණ විජේසූරිය මහතා
ආචාර්ය ඒ.පී. කීර්තිපාල
ආචාර්ය ඩබ්.ආර්.ජී. විතාරම
ජේ.ඒ.යූ.ටී. සෙනෙවිරත්න මහතා
එන්.එස්. අබේසිංහ මහතා
ඩබ්ලිව්.එන්.ඩී. කුමාරි මෙනවිය
කේ.එච්.ඩී. අබේරත්න මහතා

**සංස්කරණය සහ පිටු සැකසුම**

එම්.එස්.පෙරේරා


**උක් කර්මාන්තයට අදාල ලිපි සැපයීමෙන් පුවත් හසුන ඉදිරි කලාපයන් සඳහා ඔබටද දායකවිය හැකි අතර එම ලිපි ලේඛන, සහ ඔබගේ අදහස් සහ යෝජනා පහත ලිපිනයට යොමු කරන්න.**


සංස්කාරක,
"පුවත් හසුන"
උක් පර්යේෂණ ආයතනය,
උඩවලව.

දු.ක. 047 2233233,2233285
ෆැක්ස් 047 2233233
විද්‍යුත් තැපැල. sugarres@mail.ac.lk